ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2008-12-29** |

## සෙලාන් බැංකුවේ සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය තහවුරු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

තැන්පතු ආපසු ගැනීම සහ උද්ගත වන ද්‍රවශීලතා ගැටළු පිළිබඳව සෙලාන් බැංකුවට මුහුණදීමට සිදුවූ අපහසුතාවයන් සහ සෙලින්කෝ සමාගම් සමූහයේ මෑතකාලීන සිදුවීම් මුදල් මණ්ඩලයේ අවධානයට යොමු කර ඇත. සෙලාන් බැංකුවේ මෙම දුෂ්කරතාවයන් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට ද අනතුරුදායක විය. එමනිසා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය ඇති කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයන් ගතයුතු බව මුදල් මණ්ඩලය අදහස් කරන ලදි. මෙම තත්ත්වයන් මත 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 30 (1) ඡේදය යටතේ වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කරන ලදි.

(අ) සෙලාන් බැංකුවේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය අත්හිටු වීම;
(ආ) සෙලාන් බැංකුවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා ලංකා බැංකුව පත් කිරීම;
(ඇ) නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කරන ලෙස ලංකා බැංකුවෙන් ඉල්ලා සිටීම;
(ඇ) සෙලාන් බැංකුවේ වත්මන් ප්‍රධාන විධායක නිලධාරී සහ සියලුම වත්මන් සේවකයින් සමග කිසිදු බාධාවකින් තොරව සේවාවන් පවත්වාගෙන යාම.

සෙලාන් බැංකුව ගනුදෙනුකරුවන් සමග සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු සඳහා 2008.12.30 වන දින විවෘත කරනු ඇත.

තම සාමාන්‍ය මූල්‍ය ගනුදෙනු සෙලාන් බැංකුව සමග තවදුරටත් පවත්වාගෙන යන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මහජනතාවට දන්වා සිටින අතර, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය සහ තැන්පතුවල සුරක්ෂිතතාවය මුදල් මණ්ඩලය තහවුරු කරනු ලබයි.

PDF created with FinePrint pdfFactory trial version http://www.pdffactory.com